චක්‍රලේඛ අංක - LAE/2025- 58

මගේ අංකය :- TR/LAE/2025/CIR

මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත, රාජගිරිය.
2025.04. 16

**TR - 11**

**සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් හා**
**සියළුම දෙපාර්තමේන්තු / ආයතන ප්‍රධානීන් වෙත,**

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම 2025.05.06**
**මැතිවරණ රාජකාරී සඳහා යොදවනු ලබන නිලධාරීන්ට රාජකාරී දුම්රිය බලපත් නිකුත් කිරීම.**

2025.05.06 දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ රාජකාරී සඳහා තෝරා ගෙන ඇති ඔබගේ අමාත්‍යාංශයේ / දෙපාර්තමේන්තුවේ/ ආයතනයේ නිලධාරීන් ඡන්ද විමසීමේ රාජකාරී සඳහා පත්කර ඇති දිස්ත්‍රික්කයට යාමට රාජකාරී දුම්රිය බලපත් ඉල්ලා සිටින්නේ නම් එම ඉල්ලීම් පරිදි ඔවුනට රාජකාරී දුම්රිය බලපත් නිකුත් කිරීමට කරුණාකර පියවර ගන්න. එම බලපත් නිකුත් කිරීම්, ආයතන සංග්‍රහයේ සඳහන් දුම්රිය බලපත් නිකුත් කිරීම හා සම්බන්ධ විධිවිධාන පරිදි සිදුකළ යුතුවේ.

02). බලපත් නිකුත් කිරීමේදී පහත සඳහන් කරුණු කෙරෙහි ඔබගේ විශේෂ අවධානය යොමු කරවනු කැමැත්තෙමි.

02.1 දෙපාර්තමේන්තු සංකේත අංකය ලෙස 5422/1 රබර් මුද්‍රාවකින් සටහන් කිරීම වෙනුවට පැහැදිලි ලෙස අතින් ලියන්න.

02.2 රාජකාරියේ ස්වභාවය "2025.05.06 දින පැවැත්වෙන පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ රාජකාරී" යනුවෙන් ද සටහන් කරන්න.

02.3 වැය ශීර්ෂය :20-1-1-7-1409

03. බලපත් නිකුත් කරන ලද නිලධාරියාගේ තනතුර සටහන් කිරීමට ඇති ස්ථානයේ බලපත්‍රය අත්සන් කරන ලද නිලධාරියාගේ නිල මුද්‍රාව තබා ඊට යටින් "මැතිවරණ කොමසාරිස් ජනරාල් වෙනුවට" යනුවෙන් අකුරින් ලියන්න.

04. මේ යටතේ නිකුත් කරන සියළුම බලපත්‍ර නිරවුල් කිරීම සඳහා දුම්රිය දෙපාර්තමේන්තුව විසින් මැතිවරණ කොමිෂන් සභාව වෙත යොමු කරනු ඇත. එහෙයින් මැතිවරණ රාජකාරී සඳහා නිකුත් කරනු ලබන දුම්රිය බලපත් වෙනුවෙන් බලපත්‍ර නිකුත් කරනු ලබන අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු/ ආයතන විසින් මුදල් ගෙවීමක් සිදු කළයුතු නොවේ.

05. මැතිවරණ රාජකාරී සඳහා නිකුත් කරනු ලබන සියළුම දුම්රිය බලපත් පිළිබඳ විස්තරයක් මේ සමග අමුණා ඇති ආදර්ශ ලිපිය පරිදි සකස් කර ඡන්ද විමසීම නිමවී සති දෙකක් තුළදී මා වෙත ලැබෙන සේ එවීමට කරුණාකර කටයුතු කරන්න.

06. මෙම චක්‍රලේඛයේ පිටපතක් ඔබ අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු වෙත යැවීමට ද කරුණාකර කටයුතු කරන්න.

**සමන් ශ්‍රී රත්නායක,**
මැතිවරණ කොමසාරිස් ජනරාල්.

<u>පිටපත්:</u>

1. විගණකාධිපති
2. අතිරේක මැතිවරණ කොමසාරිස් (පළාත් පාලන)

} කාරුණික දැන ගැනීම සඳහා

3. ප්‍රධාන මූල්‍ය නිලධාරී - ශ්‍රී ලංකා දුම්රිය සේවය.
4. ප්‍රධාන මූල්‍ය නිලධාරී - මැතිවරණ කොමිෂන් සභාව
5. ප්‍රධාන ගණකාධිකාරී - මැතිවරණ කොමිෂන් සභාව
6. නියෝජ්‍ය මැතිවරණ කොමසාරිස් (පාලන)
7. සියළුම දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර මැතිවරණ කොමසාරිස්වරුන් වෙත
8. ප්‍රධාන අභ්‍යන්තර විගණක
9. ගණකාධිකාරී (ගෙවීම්)

} කාරුණික දැන ගැනීමට හා අවශ්‍ය කටයුතු සඳහා

මගේ අංකය :
දිනය :

මැතිවරණ කොමසාරිස් ජනරාල්,
මැතිවරණ කොමිෂන් සභාව,
සරණ මාවත,
රාජගිරිය.

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම - 2025.05.06**
**මැතිවරණ රාජකාරී සඳහා සහභාගී වූ කාර්ය මණ්ඩලයට නිකුත් කළ රාජකාරී දුම්රිය බලපත්**

2025.05.06 දින පැවැති පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ රාජකාරී සඳහා පත්කරනු ලැබූ නිලධාරීන්ට මෙම අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද රාජකාරී දුම්රිය බලපත්‍ර පිළිබඳ විස්තර පහත දැක්වේ.

02). මෙම බලපත්‍ර සඳහා අදාළ බිල්පත ඔබගේ වැය ශීර්ෂයන්ගෙන් නිරවුල් කිරීම සඳහා පහත විස්තර ඔබ වෙත ඉදිරිපත් කරමි.

.....................................................

ලේකම් / දෙපාර්තමේන්තු ප්‍රධානියා

(නිල මුද්‍රාව තබන්න)

අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව ..............................................................................

| (1) බලපත්‍රය නිකුත් කළ දිනය | (2) නිලධාරියාගේ නම | (3) බලපත්‍ර අංකය | (4) දුම්රිය ස්ථාන | |
|---|---|---|---|---|
| | | | ගමන ආරම්භ කළ දුම්රිය ස්ථානය | ගමන අවසන් කළ දුම්රිය ස්ථානය |
| | | | | |